# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2343/63 - 2023 අගෝස්තු මස 05 වැනි සෙනසුරාදා - 2023.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/1959 (iii)

**1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනත**

1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනතේ 7(1) සහ 8(2) වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 15 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදනු ලබන නියෝග.

**නිරාජ් ද මෙල්,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2023 තේ (අපනයන බදු සහ පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම ලියාපදිංචි තේ අපනයනකරුවකු විසින්ම, තේ කොමසාරිස්වරයා විසින් රේගු නිර්යාත ප්‍රකාශනය අනුමත කරනු ලබන අවස්ථාවේ දී, සෑම නිමි තේ කිලෝග්‍රෑමයක් මතම රුපියල් තුනක (රු.3/=) බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතුය:

එසේ වුව ද, මේ නියෝග මගින් පනවන ලද බලපත්‍ර ගාස්තුව ගෙවන ලද ලියාපදිංචි තේ අපනයනකරුවකුට පසුව යම් නිමි තේ අපනයන ඇණවුමක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත්, පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කිරීම මත එකී මුදල් ප්‍රමාණය ආපසු ගෙවන ලෙස තේ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි යඃ-

(අ) අදාළ රේගු නිර්යාත ප්‍රකාශනය සම්බන්ධව අපනයන ඇණවුමක් සිදුකර නොමැත යන කරුණ සනාථ කෙරෙන සාක්ෂි;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඇණවුම ක්‍රියාත්මක නොකිරීම සඳහා හේතු;

(ඇ) එකී මුදල ගෙවීමට අදාළ ලදුපතේ මුල් පිටපත;

(ඈ) (i) සලකා බලනු ලබන තොගය වෙනත් යම් ආකාරයකට අපනයනය කර නොමැති බව; සහ

(ii) රේගු නිර්යාත ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලද මිශ්‍රණ පත්‍රිකාවේ (Blend Sheet) විස්තර කර ඇති තේ වර්ග ඔහු විසින් සපයා නොමැති බව,

යන කරුණු සම්බන්ධයෙන් ලිඛිත වගකීම් සහතිකයක්.

3. 2 වන නියෝගයේ විධිවිධාන ප්‍රකාරව අය කරන ලද සියලු ගාස්තු, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 14 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබ ඇති ප්‍රාග්ධන අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

4. මේ නියෝගවල-

"නිමි තේ" යන්නෙන් තේ ශාකයේ පත්‍ර, පත්‍රාංකුර සහ නොමේරූ දඬුවලින් නිපදවන ලද තේ යන්න අදහස් වේ. එහෙත් මේ යටතට කසල තේ ඇතුළත් නොවේ.

EOG 08 - 0071

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.